ප්‍රියංකර, අවු: 42, ජා.හැ.අ. 8-----V, විවාහක, දරුවන් 01 , ත්‍රීරෝද රථ රියදුරු, ලිපිනය: ---

2024.03.01 දාතමින් පොලිස්පති, මානව හිමිකම් කොමිෂන් සභාව හා මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත කර තිබෙන පැමිණිල්ල.........

<u>ප්‍රධාන පෙළේ අපරාධකරුවන් වෙනුවට, පෙර වැරදි මුල් කරගෙන, අත්අඩංගුවට ගෙන, වධ හිංසාවට පත් කර, ''බොරු'' නඩු දමා පීඩාවට පත් කරන ලද නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙසට කරනු ලබන ඉල්ලීම.</u>

2024.02.11 වන දින, උදේ 7.15 ට පමණ, කළුතර විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ, තුෂාර යන නිලධාරියා ඇතුළු හය දෙනෙකු පමණ, (සිවිල් පිට) පැමිණ, නිදාගෙන සිටි මාව අත්අඩංගුවට ගත්තා.
මාංචු දමා, මාව ජීප් රථයෙන් ගෙන ගියා. එහි කසුන් හෙවත් කරවලයාගේ අම්මා හිටියා.
එහි සිටි නිලධාරියෙක්, මාගේ දුරකථනය අරගෙන, කසුන් (කරවලයාට) කථා කළා. ඔහුට කථා කරගන්න එන්න යයි කිව්වා.
නමුත් ආවේ නෑ. කසුන් (කරවලයා) ගේ නම ලිස්ට් එකේ උඩින් තියෙනවා කියා කථා වුනා.
මාව හා කසුන් (කරවලයාගේ) අම්මාව පානදුර මුහුදු වෙරලට ගෙන ගියා. පැයක් පමණ එහි හිටියා. මාව හා කසුන්ගේ (කරවලයා) අම්මා පමණයි ජීප් එක තුළ හිටියේ. ඔවුන් බැස ගියේ රථයේ වීදුරු සියල්ලම වහලා.
නැවත ජීප් රථයට ඇවිල්ලා, ''අරූ එන්නේ නැහැ'' මෙයාට, කසුන් (කරවලයා)ගේ අම්මාට හයිකෝට් එක දාමු යයි කියමින් හිටියා. ඒ අතර තුෂාර නිලධාරියා, වෙරලේ හිටිය කෙනෙක්ව අත්අඩංගුවට ගෙන, ජිප් එකට ගෙනවිත් දැම්මා.
ජීප් එක පාරේ එන විට, රිලායන්ස් එක ළඟදි, සැක පිට තවත් අයෙක්, අත්අඩංගුවට ගත්තා.
ජීප් එක පානදුර ගාලු පාරේ, ''සුපර් ෆැෂන්'' එක ළඟට ඇවිත්, කසුන්ගේ (කරවලයාගේ) අම්මාව බැස්සුවා. වෙරලේදී අත්අඩංගුවට ගත් පුද්ගලයාව, පිංවත්ත පොලීසියට බාර දුන්නා. මාව අළුත්ගම යුනිට් එකට ගෙන ගියා. එවිට වේලාව 12.00 පහුවෙලා තිබුනා.
මාව, නිලධාරීන් ඉන්න බැරැක්කයට ගෙන ගියා. මාව එහි බිම වාඩි කෙරෙව්වා.
පැය 1/2 කට පස්සේ, තුෂාර, ප්‍රසන්න යන නිලධාරීන් පැමිණ, මට, ඇඳුම් ගලවන්න කියා, අලවංගු ගෙන ධර්ම චක්‍ර ක්‍රමයට එල්ලා, රබර් හෝස් වලින්, ලී පොල්ලකින්, කකුල්වලට, ඔලුවට පද්දමින් පහර දුන්නා. පැයක් විතර එල්ලා තිබුනා.
පසුව, මූණට ෂොපින් බෑග් දමා, හුස්ම ගන්න බැරි වෙන්නට කිහිප වරක් පහර දුන්නා. සෑම දිනයකදීම, කොච්චි දමා පහර දුන්නා.
රෑට, බැරැක්කයෙන් අරන්, ''යුනිට්'' එකේ කාර්යාලයට ගෙන ගියා. නිදාගන්න දුන්නේ බිම. අත්අඩංගුවට ගෙන හිටිය අනෙක් පුද්ගලයාගේ වම් අතට, මාගේ දකුණු අත තියා මාංචු දමා තමයි නිදා ගන්න දුන්නේ.
පසුව, උදේ, බැරැක්කයට ගෙන ගොස් නැවත නිරුවත් කර, පෙර දින මෙන්ම, ධර්ම චක්‍ර ක්‍රමයට එල්ලා පහර දුන්නා. කොච්චි කොටා, ඉස්ම ඇස්වලට, කටට, ගුද මාර්ගයට දැම්මා.
තුන්වෙනි දවසේ ඒ ආකාරයටම වධ දුන්නා.
ඒ වන විට, මගේ අත්වලින් කකුල් වලින් ලේ ගලන්න පටන් අරන් තිබුනා.

2024.02.15 දින හවස, තුෂාර නිලධාරියා, දුරකථනය දී අම්මාට කථා කරන්න කිව්වා.
2024.02.16 හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළා.
තව නඩු තියෙනවා කිව්ව නිසා රිමාන්ඩ් කළා.
මාව, 2024.02.21 මතුගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළා. එහිදී ඇප දුන්නා.
2024.02.26 දින නැවත, හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළා. එදින ඇප දුන්නා.
මට විරුද්ධව සොරකම් නඩු 3 ක් දාලා තියෙනවා.
මට, ''සොරකම්'' හා ''කුඩු'' නඩු තිබූ බව පිළිගන්නවා. ඒ නඩු සියල්ල ''ව්‍යාජ'' චෝදනා නඩු. වරද පිළිගත්තේ බලපෑම්වලට යටත්ව.
මේ අවස්ථාවේදී ද පොලීසිය සිදු කළේ, සොයා ගන්න බැරි අපරාධ ''පෙර වැරදි'' දඩ මීමා කරගෙන, මට ව්‍යාජ නඩු දැමීමට උත්සාහ ගැනීමක්.
මා වරද පිළි නොගැනීම නිසා, වධ හිංසාවට භාජනය කළ බව කියා සිටිනවා.
ඉල්ලා සිටින්නේ, නීති විරෝධී ලෙසට අත්අඩංගුවට ගෙන, රඳවා තබාගෙන, ව්‍යාජ නඩු දැමූ නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙසටය.
සැ.යු. විශේෂයෙන්, විශේෂ විමර්ශන ඒකකයෙන්, හොරණ පොලීසියට බාර දෙද්දී මා සතුව තිබූ, අංකඃ 077 ෆෝ'' වර්ගයේ දුරකථනය යමෙකු අරගෙන ඇත. එය ලබාදෙන ලෙසට ඉල්ලමි.
077 අංකය පරීක්ෂා කිරීමේදී, මාගේ ප්‍රකාශය සත්‍යය බව තහවුරු කරගත හැකිය.
මෙයට,

ප්‍රියංකර